අ.පො.ස. උසස් පෙළ
13 ශ්‍රේණිය
# සිංහල I
කාලය පැය එකයි.

Channel NIE

**පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** සහ **(උ)** උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** සහ **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) ස්වාමීනි, ධ්‍යාන උපදවන්ට මට නොපිළිවන. වාද දහස උගනිමි'යි කිවුය. ඉක්බිති පරිව්‍රාජිකාවරු ද වාද දහස උගන්වාලා 'අප දන්නා වාද ඉගෙන නිමවුව. දැන් තොපි දඹදිව් තෙලෙහි ඇවිද තොප හා වාද කරන්ට සමර්ථකෙනෙකුන් බලව'යි උන්අතට දඹ අත්තක් දීලා 'පරිව්‍රාජිකාවෙනි යව'යි අවසර දී කියන්නෝ 'ඉදින් ගිහිකෙනෙක් තොප හා වාද කටහුණුවු නම් උන්ට පාදපරිචාරිකා වව. ඉදින් පැවිදිකෙනෙක් වාද කිරීමට සමර්ථ වූ නම් උන් ළඟ මහණ වව'යි උගන්වා යවුය. උයිත් දඹ අත්ත අතින් ගෙන ඇවිදිනා හෙයින් ජම්බුපරිව්‍රාජිකා නම් ව එයින් නික්ම දුටු දුටු කෙනෙකුන් හා වාද කෙරෙමින් ඇවිදිති. උන් හා වාද කටහෙන කෙනෙක් සම්භ නුවූය. ඒ ඒ තැන මිනිස්සු ජම්බුපරිව්‍රාජිකාවෝ එති බසක් ඇසූ කල ම උන්ගේ නමට ම **දුරබා** පලා යති. ඌ තුමූ ගමකට හෝ නියම්ගමකට හෝ සිඟා වදනා කල ගම්දොර එක් තැනක වැලි රැසක් කොටලා අත්ත ඊ හිඳුවාලා 'මා හා වාද කටහෙන කෙනෙකුන් දඹ අත්ත මිරිකනබව යයි' කියාලා ගමට සිඟා වදිති. වාද තබා දඹ අත්ත ළඟටත් යාහෙන්නෝ නැත. පරිව්‍රාජිකාවෝ ද ඒ අත්ත මලානික වූ කල අනික් දඹ අත්තක් හැරගනිති.

(i) වාද ඉගෙනීම නිම කළ පසු මෙහි සඳහන් තැනැත්තියට පරිව්‍රාජිකාවරුන්ගෙන් ලැබුණු උපදෙස කුමක් ද?

(ii) පරිව්‍රාජිකාවට දඹ අතු නැවත නැවත සිටුවීමට සිදු වූයේ ඇයි?

(iii) ''තොප හා වාද කටහුණුවු නම් උන්ට පාදපරිචාරිකාව වව.'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**දුරබා**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04යි)

(ආ) ''භද්දියරජ්ජුරුවෝ වැලිකෙළියෙහි පටන් එක්ව ම සුව විඳ ඇවිද්දාහු ජීවිතසමාන යහළුවා කෙරෙහි උදාර වූ ප්‍රේමයෙන් උමතු වූවාහු සිහි එළවාගත නොහී ''මොහුගේ මේ සා සැපතක් හැර මහණ වීමෙක් නම් කවර කලෙක වේ දැ''යි සිතා ''යහළු, තෙපි මහණ වා නම් මමත් රාජ්‍යශ්‍රී හැර තොප හා සමඟ මහණ වෙමි''යි කීහ. එබසට අනුරුද්ධකුමාරයෝ **අමාදියකදෙකින්**

අභිෂේකයක් ලදුවා සේ ඉතා සන්තෘෂ්ට වූවාහු ''මා සිතූ සිත ඒකාන්තයෙන් සැධෙන වනැ'' යි සිතා ''දේවයෙනි, එසේ වී නම් නොඇසූ දැ ද, අද ම මහණ වන්නට යෙමි; මා හා කැටිව අව මැනවැ'' යි කීහ. එවේලෙහි භද්දියරජ්ජුරුවෝ පර්වතයෙකින් ගැහැටු කලක් සේ රාජ්‍යලෝභයෙන් කම්පිත වූ සිත් ඇතිව, 'නොසලකා වරදවා කියාපීමි; මා කීයේ කිමෙක් දෝ හෝ'' යි සිතා ''යහළු, අපි දෙදෙන ම තව නවයෞවනයෙහි පිහිටියම්හ; දැනට කාමසුව අනුභව කොට මතු මහලුව ගිය කල සමඟව ගොස් මහණ වම්හ'' යි කීහ.

(i) භද්දිය රජතුමා මහණ වීමට අදහස් කළේ ඇයි ?

(ii) මහණ වීමට තිබූ අදහස වෙනස් කිරීමට භද්දිය රජු සිතුවේ ඇයි ?

(iii) ''පර්වතයෙකින් ගැහැටු කලක් සේ රාජ්‍යලෝභයෙන් කම්පිත වූ සිත් ඇතිව'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) **''අමාදියකදෙකින්''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි)

(ඉ) එකල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ ශෝකාග්නි වේගය සුවාසූ දහසක් යොදුන් උඩ නැඟී සක් දෙව් රජුගේ භවනය හුණු කෙළේය. ශක්‍රදේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහ බෝසතාණන් ඔත් ගල්මුදුනෙහි පෙනී, කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහ බෝසතාණන් ඇඟ ඉසලූහ. එකෙණෙහි විෂ නැසී වණය සුව ව කොතන විදි බවත් නොදත හැකි විය. මහ බෝසත් එවිට අනුන් වෙහෙසන්නට මළ වෙස් ලා වැදහොත් එකකු පරිද්දෙන් වහා නැඟී සිට සුවපත් වූයේය. - චන්ද්‍රාව ද එසඳ සුවපත් ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත් වූ සොම්නසට පැමිණ ''ස්වාමීනි යම් බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රිය කල් වූ ඇඟ අමා ඉස, නිදුක් කොට, මාගේ **එකලාකම්** දුරු කොට, ප්‍රිය වූ අප දෙදෙනා සමග කළ සේක් ද එසේ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිමි'' යි වැදහොත්තීය. ඒ ශක්‍රදේවේන්ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ, මෙතැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙත්ව'' යි අවවාද කොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ.

(i) ශක්‍රදේවේන්ද්‍රයාගේ භවනය හුණු වූයේ කවර හෙයින් ද?

(ii) මෙහි සඳහන් දෙදෙනාට සක්දෙවිඳු දුන් උපදෙස කුමක් ද?

(iii) ''මාගේ ප්‍රිය කල් වූ ඇඟ අමා ඉස, නිදුක් කොට'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) **'එකලාකම්'** යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04යි)

(ඊ) එකල්හි එනුවර යට කී උද්දාල බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට නුදුරු ව බඳපුටුවෙක පළසක් මත්තෙහි හුන්නේ ය. ගාන්ධර්ව බ්‍රාහ්මණයා ද රජහු වැඳ අවසර ගෙන වීණා ගායනා කෙරෙමින් ස්වර්ණතිලකාව හා සමඟ එකත්පස් ව හුන්නේ ය. එකෙණෙහි තමා පියාණන් පිටිපස්සෙහි හුන්නා වූ ස්වර්ණතිලකා තොමො ''උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරුදැ'' යි විචාරා තෙල භද්‍රපීඨය මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ'' යි කී කල්හි තමාගේ නිලිපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී කොඳකැකුළු මෙන් සුදුසිනිඳු දත් පෙළෙහි මනහර සුදුරසින් භින්නවර්ණ වූ අතිරක්ත **අධරයුග්මය** පොපි දෙවා මඳමඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරවගෙන උන් පළස මඳක් පහ කොට

ශරීරප්‍රභා විහිදුවාලුව. හිරුරැස් කලබක් වැනි ඒ ශරීරාලෝකය දැක උද්දාල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්යවත් ව කවර ආලෝකයෙක් දෝ හෝයි විස්මය පත් ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශෝකයෙන් දාහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුලුධාරාවෙන් තෙත් වූ නේත්‍ර ඇති ව විසංඥ විය.

(i) උද්දාල බ්‍රාහ්මණයා පොලඹවා ගැනීමට ස්වර්ණතිලකා යෙදූ උපක්‍රමය කුමක් ද?

(ii) ස්වර්ණතිලකා දැකීමෙන් උද්දාල බ්‍රාහ්මණයා තුළ ඇති වූ වෙනස විස්තර කර ඇත්තේ කෙසේ ද?

(iii) ''සුදුසිනිඳු දත් පෙළෙහි මනහර සුදුරසින් භින්නවර්ණ වූ'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) **'අධරයුග්මය'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි)

(උ) අ සු ර න් ජය ගෙන සිත සේ
සුර සෙන් කෙළි සැණකෙළි සේ
රිසි නන් වෙස් ගෙන සොඳ සේ
සතොසින් සැණකෙළිති මෙ සේ

පුරවා **තුරු රැවින්** අහස
කරවා ගී නැටුම් වෙසෙස
අරවා සතසිත දොම්නස
පුරවා සිත් කෙළිත මෙලෙස

(i) සැණකෙළිය නිසා පුරවාසීන්ගේ සිත්හි ඇති වූ වෙනස කුමක් ද?

(ii) පුරවාසීන්ගේ සැණකෙළිය උපමා කොට ඇත්තේ කුමකට ද?

(iii) ''රිසි නන් වෙස්ගෙන සොඳ සේ'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) **'තුරු රැවින්'** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි)

- **(ඌ)** සහ **(එ)** ප්‍රශ්න **දෙකට** ම පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) 'බල එකෙක් නම් මියයන ගමනේ මා සිතක් මතක් සේ වැඳගත දුනමැනැවැ'

(ii) 'අපි උපයන අවස්ථාවෙහි මෙසේ සියුම්ව උපයන සේත් දනුම්හ'

(iii) 'පළමු මෙසේ වූ නොකටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි'

(iv) 'තොප ඇමදෙනා අතුරෙන් පරදේශයට ගිය මිනිසුන් මරන්ට කවරෙක් සමර්ථ ද'

(v) ''ළමයා බොහො ම ළපටි යි. ඈ උඹට දෙන්ට බෑ. ඒකෙන් අපල ඇති වෙන්ඩ පුළුවනි''

(vi) ''අපි ඒ කාලෙ ඉස්කෝලෙ නොගිය එකේ විපාක තමයි මේ විඳවන්නෙ''

(vii) ''මා යවන්ට කැමති ද ඔබ
නිරතුරු ඇවිටිලි කරන්නෙ?''

(ලකුණු 03×4 =12යි)

(එ) වස්තු විෂයයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

නොවැලපෙමි, ඔබ යන්න - වැලප ඇති පල කිම් ද?
ජීවිතේ වැරදුණේ මෙතැන විතරක් නො වේ
සූරලා ගෙන යන්න මා හදේ පිපුණ මල්
මල් නගන වසන්තය ඔබට ගෙන යා හැකි ද?

නොවැලපෙමි, ඔබ යන්න - වැලප ඇති පල කිම් ද?
ඔබේ නම අදින් පසු තවත් මට අයිති නෑ
ඔබ නැත ද ජීවිතේ නසාගත නොහැක මට
ඔබ යන්න ජීවිතේ සොයාගෙන සොයාගෙන

ඔබ යන්න මධුරතර සප්ත ස්වරයත් අරන්
ඔබේ රථ මැදිරියට මගේ ඉර - හඳ අරන්
ඔබ යන්න මහද තෙත් වැහිවලාකුළ අරන්
කමක් නෑ ඔබ යන්න - මගේ ආයුස අරන්

දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
ඔබ නැතත් - මම එතැන පාට හත ගණින්නම්
ඔබ යන්න හැරී නොබලා ඔබේ කිරුළ ගෙන
පරාජිත කඳුළකට ඇසේ ඉඩ තියා නැත

වෙස්මුහුණ පැලඳගෙන සිටින තැන හිතක් නැත
ගෙවදින්න ඇති නිසා හෙට අලුත් විමානෙට
පෙම් ගී අලංකාර වීසි කොට යනු මැනවි
නිල් ගුවන් ගැබ වදින කුරුල්ලකු පරිද්දෙන්
ඔබ ඔබේ සිහිනයට - මම මගේ ලෝකයට

හෙමින් මා අත අතැර - දෙපස සෙවණැලි අතර
ඔබ සෙමෙන් හැංගුණේ, එය වඩා විනීතයි
එදා ඔබ ගෙයි මුල්ලෙ - සොයා ගත් මං දිනුම්
ඔබ සැඟව ගියෙ කොයි ද - සොයන්නේ නෑ ඉතින්

ජය පරාජය කවුද - මට එයින් පලක් නැත
ආදරය නින්දක් ද - පිබිදිලා සිටින මට
දිනෙන් දින මගේ නෙත් පැහැදුල් ය, සුවිපුල් ය
නින්ද තුළ නැති වුණේ එක දෙයයි - වරදක් ද?
තව බොහෝ දේ තිබේ - ජීවිතේ ජය ගනිමි (ලකුණු 12යි)

2. සද්ධර්මරත්නාවලි කතුවරයා මුඛ්‍ය චරිත ඉස්මතු කිරීමෙහි ලා අවශේෂ චරිත උපයුක්ත කර ගන්නා ආකාරය නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න.

**නැත හොත්,**

සංකීර්ණ අවස්ථාවල දී පුද්ගල චරිත හැසිරෙන ආකාරය තාත්වික ව නිරූපණය කිරීමට කතුවරයා දැක්වූ කුසලතාව නිර්දිෂ්ට ජාතක කථා ආශ්‍රයෙන් විමසන්න. (ලකුණු 15යි)

3. සදාචාරසම්පන්න සමාජ පැවැත්මකට ඉවහල් වන සදුපදේශ කතා රසයෙන් අනූන කොට ඉදිරිපත් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා ගන්නා ප්‍රයත්නය සාර්ථක වී ඇත් දැයි නිර්දිෂ්ට කථා ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැත හොත්**

''අභව්‍ය සේ පෙනී යන සිදුවීම් පවා විශ්වසනීයත්වයෙන් යුතු ව කතා රසය දනවන පරිදි විවරණය කෙරෙන අවස්ථා පූජාවලියෙහි දක්නට ලැබේ'' නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න. (ලකුණු 15යි)

4. (අ) කෝට්ටේ යුගයේ සිංහල පද්‍ය සාහිත්‍යය, වස්තු විෂයය සම්බන්ධයෙන් දක්වන විවිධත්වය කෙබඳු දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07යි)

(ආ) ගුත්තිල කාව්‍යයෙහි ඇතුළත් සුරඟන රැඟුම ඇසුරෙන් වෑත්තෑවේ හිමියන්ගේ විශිෂ්ට කවිත්වය පිළිබිඹු කෙරෙන ආකාරය නිදසුන් සහිත ව පහදන්න. (ලකුණු 08යි)

5. ''දරිද්‍රතාවෙන් හා නූගත්කමින් මිරිකී සිටින ජනයා බලවතුන්ගේ පීඩනයෙන් ද අසරණභාවයට පත් වන අයුරු බැද්දේගම නවකතාවෙන් නිරූපිත ය'' නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

6. ''ආර්ථික දුෂ්කරතා හා විරැකියාව හේතුවෙන් පීඩනයට පත් වන ජන ජීවිතයේ යථා ස්වභාවය කලාත්මක අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමට නූතන කෙටිකතාකරුවා සමත් වේ'' නිර්දිෂ්ට කෙටිකතා තුනක් ඇසුරෙන් මෙම කියමන පරීක්ෂා කරන්න. (ලකුණු 15යි)

7. මවුපියන් හා දූදරුවන් අතර පවත්නා සාධනීය බැඳීම අපූර්වත්වයෙන් යුතු ව විදහා දැක්වීමට නූතන කවීන් ගන්නා ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී ඇත් දැයි නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

8. ජීවිත අභියෝගවලට මුහුණ දෙන පුද්ගල චරිතවල සියුම් මනෝභාව යථාර්ථවත් ලෙස නිරූපණය කිරීමෙහි ලා එදිරිවීර සරත්චන්ද්‍රයන් සමත් වන්නේ ද යන්න 'පෙමතො ජායතී සොකො' නාට්‍ය පෙළ ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15යි)

අ.පො.ස. උසස් පෙළ

13 ශ්‍රේණිය

# සිංහල II

**කාලය පැය තුනයි.**

Channel NIE

**I** කොටසේ 1 ප්‍රශ්නය ද, **II** කොටසේ **2, 3** ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා **එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.**

1.1 සිංහල අක්ෂර මාලාවෙහි එන ''ව්'' යන්න කවර ගණයකට අයත් අක්ෂරයක් ද?

(1) දන්තජ අඝෝෂ ඌෂ්ම
(2) දන්තෞෂ්ඨජ ඝෝෂ අර්ධස්වර
(3) දන්තෞෂ්ඨජ අඝෝෂ අර්ධස්වර
(4) දන්තජ ඝෝෂ අර්ධස්වර
(5) දන්තජ ඝෝෂ ඌෂ්ම (-------)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) න්‍යෂ්ඨීය, ශ්‍රේෂ්ටාධිකරණ, පරිඝනක, සාමර්ථ්‍යය, විෂ්කම්භය
(2) න්‍යෂ්ඨීය, ශ්‍රේෂ්ඨාධිකරණ, පරිගණක, සමර්ථ්‍යය, විෂ්කම්භය
(3) න්‍යෂ්ටිය, ශ්‍රේෂ්ඨාධිකරණ, පරිගණක, සාමර්ථ්‍යය, විෂ්කම්භය
(4) න්‍යෂ්ඨීය, ශ්‍රේෂ්ඨාධිකරණ, පරිඝනක, සාමර්ථ්‍යය, විශ්කම්භය
(5) න්‍යෂ්ටිය, ශ්‍රේෂ්ටාධිකරණ, පරිගණක, සමාර්ථ්‍යය, විශ්කම්භය (-------)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) ඉරාකය, ඉරානය, ඉන්දියාව, ඉන්දුනීසියාව
(2) පකිස්තානය, පින්ලන්තය, පිලිපීනය, පෝලන්තය
(3) ජපානය, ජැමෙයිකාව, ජර්මනිය, ජෝර්දානය
(4) ඇමරිකාව, ආර්ජන්ටිනාව, අයිස්ලන්තය, අප්‍රිකාව
(5) මාලදිවයින, මියන්මාර්, මැඩගස්කරය, මෙක්සිකෝව (-------)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සඤ්ඤක අක්ෂර අර්ධානුනාසික්‍ය අක්ෂර නමින් ද හැඳින්වේ.
(2) සඤ්ඤක අක්ෂර වචනයක මුල යෙදේ.
(3) අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර සියල්ල හයකි.
(4) සිංහල භාෂාවට සඤ්ඤක අක්ෂර ලැබී ඇත්තේ සංස්කෘත භාෂාවෙනි.
(5) තත්සම පදවල සඤ්ඤක අකුරු දැකිය හැකි ය. (-------)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) අගමැති මන්දිරය, අපිස් ජීවිතය, අවමඟුල් උත්සවය, අමනුෂ්‍ය උවදුර

(2) ඔසු උයන, කම් විභක්තිය, චන්ද්‍ර මඬල, ඇදුරු මඬුල්ල

(3) දේශීය වෙදකම, පාඨශාලා ආචාර්ය, පහන් ආලෝකය, සුන්දර දසුන්

(4) විහාර මන්දිරය, ශුභ ප්‍රාර්ථනා, බොදු සිරිත්, සූර්ය මණ්ඩලය

(5) වියරණ විදි, සබඳ විබත, වෙස්සන්තර ජාතකය, දෑ අභිමානය (-------)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ප්‍රාණි, ද්‍රෝණි, ශ්‍රේණි, ශ්‍රෝණි

(2) දෙස්, විදෙස්, පෙදෙස්, අදෙස්

(3) විස, වස, විෂ, වහ

(4) ශත්‍රු, ශාස්ත්‍ර, ශ්‍රැත, සැත

(5) නිදාන, නිධාන, නුවන, නයන (-------)

1.7 තත්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) සයන, ගුවන, ලවණ, පවන

(2) ප්‍රදාන, ප්‍රධාන, ප්‍රණාම, ප්‍රමාණ

(3) පිළිකුල, පිළිවෙළ, පිළිබඳ, පිළිසිඳ

(4) ගත, සත, පත, චුත

(5) තරුණ, දෙරණ, අරණ, වරණ (-------)

1.8 කරණ, සබඳ, අවදි, අදර යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) මිහිදුම්, මල්පැණි, කිරිබත්, කුරුලුපිහාටු

(2) කිරිබත්, කුරුලුපිහාටු, මිහිදුම්, මල්පැණි

(3) මල්පැණි, කුරුලුපිහාටු, මිහිදුම්, කිරිබත්

(4) කිරිබත්, මල්පැණි, මිහිදුම්, කුරුලුපිහාටු

(5) කුරුලුපිහාටු, මිහිදුම්, මල්පැණි, කිරිබත් (-------)

1.9 කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) රැකිලි, රිකිලි, දැඟලිලි, සැරසිලි

(2) ඉස්සීම්, ගැස්සීම්, බැස්සීම්, පැස්සීම්

(3) බිඳුණු, මිදුණු, ඉදුණු, ගිලුණු

(4) නැටුම්, ගැයුම්, රැකුම්, ලියුම්

(5) කළ, මළ, වපුළ, වගුළ (-------)

1.10 පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ගුරු සිත **නොරිදවා**

(ආ) **පළමින්** තුඩින් පැහැදුළ

(ඉ) **කියනුව** සිතනු ඇති ලෙස

(ඊ) **ලෙළවත** සුරත සදහස

(1) පූර්වක්‍රියා, අපරක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා

(2) අපරක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා

(3) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, අපරක්‍රියා

(4) අසම්භාව්‍යක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අපරක්‍රියා

(5) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අපරක්‍රියා, අසම්භාව්‍යක්‍රියා (-------)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) රූමත්, බුද්ධිමත්, විධිමත්, දිරිමත්

(2) පුතණු, මලණු, මයිලණු, මුත්තණු

(3) රන්මුවා, දඬුමුවා, මිණිමුවා, සෙල්මුවා

(4) විශිෂ්ටතම, වෘද්ධතර, ශෛලමය, නර්තන

(5) නුවනත්, මුහුණත්, සවනත්, ගහණත් (-------)

1.12 උපසර්ගයක් **යෙදී නොමැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සුපතළ, සුසිනිඳු, සුලකර, සුවිසල්

(2) සංකීර්ණ, සංගායනා, සංකේත, සංවහන

(3) සතන්, සසිරි, සපිරි, සදය

(4) අනුමාන, අතිමහත්, නිරාහාර, අපහාස

(5) නිෂ්ක්‍රිය, නිෂ්ප්‍රභ, නිස්සරණ, නිශ්ශබ්ද (-------)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නෙක්, දක්වා, තුරු, පටන්

(2) පමණ, තරම්, විතර, සා

(3) වෙනුවෙන්, අරභයා, වස්, සදිසි

(4) අහෝ, අනේ, අයියෝ, අපොයි

(5) මෙන්, වැනි, විලස, අයුරු (-------)

1.14 ''විරාගත **සම්ප්‍රදායානුකූල** වත්පිළිවෙත්වලින් අනතුරුව **අසිරිමත්** දළදා පෙරහර වීථී **සංචාරය** කරයි'' යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් මුද්‍රිත** පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, උපසර්ග, තද්ධිත

(2) තද්ධිත, සන්ධි, උපසර්ග

(3) උපසර්ග, සන්ධි, තද්ධිත

(4) සන්ධි, තද්ධිත, උපසර්ග

(5) තද්ධිත, උපසර්ග, සන්ධි (-------)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) දුටුවෝ ය, බැලුවෝ ය, කැපී ය, පැන්නේ ය.

(2) රැඳුණා ය, බැඳුණා ය, සැදුණි, වැදුණි.

(3) තබාලා, දමා, නරඹා, දුවත

(4) ලියන්නී ය, කපන්නී ය, දරන්නෝ ය, වයන්නෝ ය.

(5) දැකදැක, රැකරැක, කමින්, පැනපැන (-------)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නිල්අහස, ගස්වැල්, දසබල, දියකිඳුරා

(2) සුදුරෙදි, වරලස, ඉරහඳ, වනමල්

(3) පාදපද්ම, කවිසිළුමිණ, ශාක්‍යසිංහ, දසපාරමිතා

(4) ගිනිබිය, ගුරුඋපදෙස්, ගල්හිත, එළුමස්

(5) හෙළබොජුන්, නළුනිළියෝ, මලවි, පබල (-------)

1.17 එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) මඟුලැතා, යකැදුරා, නිරිඳු, රනෝවිලි

(2) ශාලාධිපති, පියතුමා, මුනිඳු, සුරිඳු

(3) තම්පලා, මුංඇට, නියංසමය, කොළොම්පුරේ

(4) මුනීන්ද්‍ර, වටොර, කොස්සැට, ගුරූපදේශ

(5) මහියංගණ, අල්ලස්, මැදැඟිල්ල, රාජාභිෂේක (-------)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** වරණය තෝරන්න.

(1) සෛද්ධාන්තික, භෞතික, ලෞකික, නෛතික

(2) පැණිවළලු, කළුදොදොල්, නාරංකැවුම්, මුංකිරිබත්

(3) ආදර්ශවත්, ආලෝකවත්, සිල්වත්, ප්‍රමාණවත්

(4) කියත, ගයත, වයත, විරිත

(5) වක්කඩ, අස්සන, අග්ගළා, දුප්පත් (-------)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) කවීකයකු සභාව අමතද්දී ඇතැමෙක් අත්පොළසන් දුන්හ.

(2) ගුරුවරු සිසුන් යහමග යවති යි දෙමාපියෝ සිතති.

(3) පිරිසිදු පරිසරයක පිහිටි මාගේ කුටියේ මදුරුවන් නැත.

(4) ඕ තොමෝ විසිතුරු ඇඳුමෙන් සැරසී උත්සවයට සහභාගි වෙති.

(5) අපි වසංගත රෝගවලින් වැළකී සිටිය යුතු ය. (-------)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) ඇයි දරුවෝ පාසල් නාවේ?

(2) වැරදි කරන අයට මේවා හොඳ පාඩම්.

(3) මම ආසාවෙන් බතල කෑවා.

(4) එයාල අපිව දකින්නැති.

(5) සිසුන් ඉගෙන ගන්නේ මොනවා ද? (-------)

(ලකුණු 20යි)

## <u>II කොටස</u>

- මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කිසියම් භාෂාවක් කථා කරන භාෂක සමාජය සැතපුම් සියදහස් ගණනක් විශාල භූමි ප්‍රදේශයක් පුරා විහිදී ගිය කල්හි, කල් යෑමේ දී ප්‍රදේශයෙන් ප්‍රදේශයට භාෂා ව්‍යවහාරය පිළිබඳ යම් යම් වෙනස්කම් මතු වී ආ හැකි ය. ප්‍රදේශයෙන් ප්‍රදේශයට ගමනාගමන පහසුකම් හා වෙනත් සන්නිවේදන පහසුකම් වෙනස් වීම මෙයට එක් හේතුවකි. ගම් දෙකක හෝ ජනාවාස දෙකක පිරිස් අතර සන්නිවේදන සනත්වය අඩු කරවන භූගෝලීය බාධක මෙන් ම එක ම පෙදෙසෙහි වුවත් සමාජයේ එක් කොටසක් හා තවත් කොටසක් අතර සන්නිවේදන සනත්වය අඩු කරවන සමාජීය බාධක ද තිබිය හැකි ය. එක ම භාෂක සමාජයේ කොටස් දෙකක් අතර ඇති වන භූගෝලීය දූරස්ථභාවය මෙන් ම සමාජීය දූරස්ථභාවය ද අන්‍යෝන්‍ය සමීප සම්බන්ධතාවලට, අන්‍යෝන්‍ය සන්නිවේදන සනත්වයට බාධා පමුණුවයි. එසේ ම එම දෙපස අතර ආකල්පමය වශයෙන් ඇති වෙනස්කම් ද එබඳු තවත් බාධකයක් වෙයි. එකී දෙපසට වෙන් වෙන් ව බලපාන සංස්කෘතික සංස්පර්ශයන්ගේ විවිධත්වය ද ව්‍යවහාර විවිධත්වයට හේතු වන්නකි. විශේෂයෙන් භාෂණයන්ගේ ගැමි-නියැරි වෙනසට මෙය එක් හේතුවක් වෙයි. මෙසේ එක් ප්‍රදේශයක හෝ එක් කොටසක භාෂා ව්‍යවහාරය තවත් ප්‍රදේශවල හෝ තවත් කොටස්වල හෝ භාෂා ව්‍යාවහාරයට වඩා ඇතැම් අංගවලින් වෙනස් වන අතර ම, ඒ ප්‍රදේශය තුළ හෝ ඒ කොටස තුළ හෝ සිටින සාමාජිකයන්ට පොදු වූ ලක්ෂණ සෑහෙන ගණනකින් සමන්විත වන කල්හි, එම ප්‍රදේශීය ව්‍යවහාරයට නැත හොත් සමාජඛණ්ඩයේ ව්‍යවහාරයට 'උපභාෂා' යැයි කියනු ලැබේ.

මේ අනුව, උපභාෂාව පුද්ගලභාෂණයත් භාෂාවත් යන දෙකෙහි අතරමැදියකු සේ සැලකිය හැකි ය.

වෙනස් වීම සෑම ජීවභාෂාවක ම ස්වාභාවික ලක්ෂණයකි. කිසියම් ප්‍රදේශයක උපභාෂක සමාජයකට අන්‍යතර භාෂාවක නිරන්තර ආශ්‍රය හා සංස්කෘතික සංස්පර්ශය ලැබෙන විට, එම උපභාෂාව එබඳු ආශ්‍රයක් නොලබන හෝ වෙනත් භාෂාවක ආශ්‍රය ලබන හෝ සහෝදර උපභාෂාවන්ට වඩා ඉක්මනින් වෙනස් වීමට භාජන විය හැකි ය. මෙසේ වෙනස් වීමට භාජන වන උපභාෂාවක් එම බසේ වෙනත් උපභාෂා කථා කරන්නන්ට අපහසුවකින් තොර ව වටහා ගත හැකි තාක් 'උපභාෂා' නමින් ම හැඳින්වෙන අතර, එසේ වටහා ගැනීම අපහසු වන තරමට වෙනස්කම් වර්ධනය වූ කල්හි එය වෙන ම භාෂාවක් සේ සලකනු ලැබේ.

(i) ඕනෑම ජීව භාෂාවක පැවතිය හැකි ස්වාභාවික ලක්ෂණය කුමක් ද?
(ii) 'උපභාෂාව' යන්න හඳුන්වා ඇත්තේ කෙසේ ද?
(iii) කිසියම් උපභාෂාවක් වෙනත් භාෂාවක් බවට පත් වන්නේ කිනම් අවස්ථාවක ද?
(iv) උපභාෂාවකින් සිදු කෙරෙන ප්‍රධාන කර්තව්‍යය කුමක් ද?
(v) අන්‍යෝන්‍ය සන්නිවේදන සනත්වයට බාධා පමුණුවන හේතු සාධක **දෙකක්** සඳහන් කරන්න.
(vi) ප්‍රදේශයෙන් ප්‍රදේශයට භාෂා ව්‍යවහාරයේ වෙනස්වීම් ඇති වීමට හේතුව කුමක් ද?

(ලකුණු 12යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වර්තමාන ලෝකයේ ප්‍රභූත්වය උසුලන ඉංගිරිසි භාෂාවේ ඇත ම අවධිය ක්‍රිස්තු වර්ෂ පස් වන සියවසත් සත් වන සියවසත් අතර කාලය සේ සැලකේ. දකුණු ආසියාවේ විශාලතම භාෂක සමාජය සහිත හින්දී බසෙහි ප්‍රභව සමය සත් වන සියවස සේ ද, බෙංගාලි බසෙහි ප්‍රභව සමය 10-12 සියවස් අතර කාලය සේ ද සැලකේ. යුරෝපා මහාද්වීපයේ පෘථුලතම ව්‍යවහාරය සහිත දේශජ භාෂාව මෙන් ම යුරේශියානු භූගෝලීය කලාපයෙහි පෘථුලතම ව්‍යාප්තිය සහිත භාෂාව ද වන රුසියානු බසෙහි ආරම්භක අවධිය තුදුස් වන සියවස තරම් කාලය යැයි පිළිගැනේ. එහෙත් සිංහලයේ ආදිතම ලේඛන ක්‍රිස්තු පූර්ව තෙවන - දෙවන සියවස් අතර කාලයට අයත් වන අතර, සාහිත්‍යකරණයේ ආරම්භය ද ඒ හා සමාසන්න බවට වාර්තා හමු වෙයි. අවිනෂ්ට පුරාණතම සාහිත්‍ය නිදර්ශන වන සීගිරි ගීවලින් පෙනී යන්නේ සවන - සත් වන සියවස් කාලය වන විට සිංහලයෙන් දියුණු සාහිත්‍යයක් ගොඩ නැඟී ආ හැකි ආකාරයේ භාෂාමය වර්ධනයක් පැවති බව යි. සිංහලයේ අවිනෂ්ට පුරාණතම සාහිත්‍ය කෘති නව වන - දස වන සියවස් අතර කාලයට අයත් වෙයි. ඒ වන විට කලාපයේ දියුණු පැරණි සාහිත්‍ය උරුමයක් සහිත භාෂා වන සංස්කෘත හා පාලි භාෂා සමඟ සම කළ හැකි මට්ටමේ සාහිත්‍ය වර්ධනයක් සිංහලය විසින් ද අත්පත් කොට ගෙන පැවති බව එකී කෘතිවලින් ස්ඵුට වෙයි.

(ලකුණු 13 යි)

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) නූතන වාණිජවාදී ආකල්ප නිසා අභියෝගයට ලක් ව ඇති සාම්ප්‍රදායික කලා ශිල්ප

(ii) බලවතුන්ගේ යුද මානසිකත්වය හමුවේ ගෝලීය ආර්ථිකයට සිදු ව ඇති බලපෑම

(iii) විදෙස් රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයන් යොමු කිරීමේ යෝග්‍යතාව

(iv) නව ජීවනෝපාය ක්‍රම ප්‍රවර්ධනය සඳහා අන්තර්ජාලයෙන් ලැබෙන පිටුවහල

(v) පුද්ගල හා සමාජ සංවර්ධනය කෙරෙහි ක්‍රීඩාවේ දායකත්වය

(ලකුණු 25යි)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) ආරක්ෂක හමුදාවල සෙබළියන් ද ඇත.

(ii) සියලු අරගලකරුවෝ තම විරෝධය ප්‍රකාශ කළහ.

(iii) සේවකයෝ පැමිණියහොත් අපි කර්මාන්තශාලාවේ වැඩ ආරම්භ කරමු.

(iv) රියැදුරන් විසින් මඟීහු බස් රථයට නංවා ගන්නා ලදි.

(v) රාජ්‍ය නිලධාරීහු මෙහෙට සේවය සඳහා වාර්තා කරාවි.

(ලකුණු 01 x 5 = 05යි)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) අපි උද්‍යැසනින් ම සියලු දරුවන් සැණකෙළි භූමියට කැඳවා ගෙන ගියෙමු.

(ii) කර්මාන්ත ශාලා හිමියෝ වර්ෂාවසානයේ දී සේවකයන්ට ප්‍රසාද දීමනා පිරිනමති.

(iii) රාජ්‍ය නායකයා විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන් බුහුමන් සහිත ව පිළිගත්තේ ය.

(iv) පොදු රාජ්‍ය මණ්ඩලීය තරග ජයග්‍රාහිකාවක් සිය පුහුණුකරුට ප්‍රණාමය පුද කළා ය.

(v) වාදක කණ්ඩායම මියුරු සරින් ප්‍රේක්ෂකයන් පිනවයි.

(ලකුණු 01 x 5 =05යි)

(ඉ) ව්‍යාකරණානුකූල වාක්‍යයක් නිර්මාණය කිරීමට යෝග්‍ය පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ප්‍රතිභාසම්පන්න(කවියකු/කවියෙක්) වූ මහගම සේකර දක්ෂ නවකතා (රචකයකු/රචකයෙක්) ද විය.

(ii) තම (දරුවෝ/දරුවන්) නිවසට පැමිණෙති යි (දෙමාපියන්/දෙමාපියෝ) සතුටෙන් පසුවෙති.

(iii) වීදි නාට්‍ය කණ්ඩායමේ එක් (අයකු/අයෙක්) රංගනයෙන් ඉවත් (විය/වූහ)

(iv) රංගන (ශිල්පීන්/ශිල්පීහු) සිය කුසලතා දක්වද්දී (අප/අපි) එහි අසිරිය විඳගතිමු.

(v) රටේ (පාලකයෝ/පාලකයන්) ආදර්ශවත් වෙත් ද (පුරවැසියන්/පුරවැසියෝ) ද යහමඟ යනු ඇත.

(ලකුණු 01 x 5 =05යි)

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **චිරන්තන** සාහිත්‍ය **නිර්මාණයන්හි** ජීවිතයට අවශ්‍ය **උපදේශාර්ථ** ද ගැබ් වෙයි.
(**චිරන්තන** - තද්ධිත, **නිර්මාණයන්හි** - විභක්ති, **උපදේශාර්ථ** - සන්ධි)

(ii) **මවුපියෝ** දරුවන් **උදෙසා** අපමණ දුක්පීඩා **උසුලති.**
(**මවුපියෝ** - සමාස, **උදෙසා** - නිපාත, **උසුලති** - ක්‍රියා පද)

(iii) **උපසභාපතිවරයා දැක්වූ** අදහසට අපි සියල්ලෝ **ම** එකඟ වූයෙමු.
(**උපසභාපතිවරයා** - සමාස, **දැක්වූ** - කෘදන්ත, **ම** - නිපාත)

(iv) **දක්ෂ** ගායිකාවක් **සුමියුරු** ගැයුමෙන් සභාව **ප්‍රබෝධවත්** කළා ය.
(**දක්ෂ** - විශේෂණ, **සුමියුරු** - අව්‍යය පද, **ප්‍රබෝධවත්** - තද්ධිත)

(v) මිනිසුන් බලා **සිටිද්දී ගංවතුර** ප්‍රධාන මාර්ගය **තෙක්** පැතිරී ගියේ ය.
(**සිටිද්දී** - අසම්භාව්‍ය ක්‍රියා, **ගංවතුර** - සන්ධි, **තෙක්** - නිපාත)

(ලකුණු 03 x 5 = 15යි)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) අභ්‍යවකාශ තරණය _ _ _ _ _ _ වර්ගයා අත් කර ගත් විශාල ජයග්‍රහණයකි.

(ii) පරමාණු බෝම්බ හෙළීමෙන් සිදු වූ _ _ _ _ _ _ විනාශය ගණනය කළ නොහැකි තරම් ය.

(iii) _ _ _ _ _ _ වියේ පසු වන්නන් අපේක්ෂා භංගත්වයට පත් නොකළ යුතු ය.

(iv) මෙවර නව අවුරුදු සැණකෙළිය _ _ _ _ _ _ විදුහල් බිමෙහි පැවැත්වේ.

(v) මූලික _ _ _ _ _ _ අයිතිවාසිකම් රැකීම ඕනෑ ම රජයක වගකීම ය.

(vi) දරුදැරියෝ _ _ _ _ _ _ අවධියේ දී නිර්මාණශීලී ව කටයුතු කරති.

(යෞවන, මහ, මනුෂ්‍ය, යොවුන්, මිනිස්, මහා)

(ලකුණු ½ x 6 = 03යි)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

අද අපට බඩගින්නෙ ඉන්නැතුව ජීවත් වීමට පුළුවන් වුණේ පුරාණ රජවරුන් දුර දිග බලලා හදපු වැව් අමුණු හින්දයි.

(ලකුණු ½ x 6 = 03යි)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) වෛද්‍යවරුන්ගේ **ප්‍රතිකාරවලින්** රෝගියා **සුවය** ලැබී ය.

(ii) පොල් **ගසේ** ගෙඩි, කොළ ආදි සියලු **දේ** ප්‍රයෝජනයට ගැනේ.

(iii) මගියෙක් **අසුනෙන්** නැගිට වියපත් **මවකට** වාඩි වීමට ඉඩ දුන්නේ ය.

(ලකුණු ½ x 6 = 03යි))

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

ඔබ දක්ෂ පාලකයෙකි දේශ හිතෛෂියෙකි කුලුණෙන් තෙත් වූ හද ඇත්තෙකි නියමුවාණනි රටට අවශ්‍ය ම මොහොතෙහි අප හැර ගියේ ඇයි එම වියෝව දරාගත නොහැකි ය. මතු භවයෙත් ඔබ මේ දේශයෙහි ම ඉපිදේවා (ලකුණු ½ x 6 = 03යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) ''අපි තරගයෙන් අනිවාර්යයෙන් ජය ලබමු'' යි ඔවුහු පැවසූහ.

(ii) ''තරුණ තරුණියන් ශ්‍රමදානයට මහත් උනන්දුවෙන් සහභාගි වූහ'' යි ගම්වැසියෙක් කීවේ ය.

(iii) ''රට ගොඩනගන්නට උදවු කරන්න'' යි නායකයා පුරවැසියන්ගෙන් ඉල්ලා සිටියේ ය.

(ලකුණු 01 x 3 = 03යි)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෝකිල ශාරිකාදීන්ගේ විනෝදයට කැප වුණු **සල්, සපු, නා, පුවඟු, කොබෝලීල** ආදි අනේකවිධ තුරු පෙළින් ද මිහිලොල් කැලගේ දිවා නිවාස වූ **දෑසමන්, සෙව්වන්දි** ආදි මලින් බර කුඩා රුක් රොදින් හෙබි තෝතැනිවලින් ද මල් සුවඳ උකා ගනිමින් හමන මන්ද මාරුතයට සිසිල් ජල රොන් සලා දුන් දිය මලින් ද සමලංකෘත ව සක් දෙවිඳුගේ නඳුනුයනට නිගා දුන් මනෝනන්දනීය මල් උයනට පිවිසි රූබර ලලනාව නම් ස්වකීය රූ සපුවෙන් සකල දඹදිව් තලෙහි දසත ලියැලැවූ කිතුලිය ඇති දමයන්තිය මිස අනෙකක් නොවේ. රන්ලිය අනුව සිටි විදිලිය පෙළක් සේ ඇය අනුගමනයෙහි යෙදෙන්නෝ ඇගේ පරිවාර ලලනාවෝ ය. රූප ශෝභාවෙන් අග තැන්පත් තමන් අතට පත් වීමට ඔවුනොවුන් හා තරග කරන්නාක් මෙන් සැලෙන විවිධ වර්ණවත් කුසුම් කැන් දෙස බල බලා මංගල පුෂ්කරණීය දෙසට ගමන් ගත් දමයන්තියගේ නෙත් පහර එහි සිටි අපූර්ව ශෝභා ඇති හංසයකු දෙසට නිතැතින් ම ඇදුණේ ය.

(i) තද කළු අකුරෙන් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) කැලගේ, කිතුලිය, ලලනාවෝ යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ස්වර සන්ධියට අයත් පද **තුනක්** මේ ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) මලින්, අනුගමනයෙහි, හංසයකු යන වචනවල ප්‍රත්‍යය වෙන් කරන්න.

(v) තාලුජ අඝෝෂ ඌෂ්මාක්ෂරයක් හා ඝෝෂ මහාප්‍රාණයක් අන්තර්ගත වචනයක් උපුටා දක්වන්න. (ලකුණු 03 x 5 = 15යි)

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ද්විත්ව රූප සන්ධිය

(ii) භාව කාරක කෘදන්ත

(iii) අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා

(iv) ඕෂ්ඨජ අක්ෂර

(v) ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය (ලකුණු 05 x 3 =15)